පොතුවිල

මන්ත්‍රෞෂධ සිද්ධසාරය.

ප්‍රථම භාගය.

පොතුවිලේ වෙද පරපුරට අගමිණක් බඳු

පොතුවිලේ

ශ්‍රී ඉන්දජෝති මාහිමියාණන් වහන්සේ සහ

— තත් සොහොයුරු ශිෂ්‍ය —

පිංලන් කුඩලානර විජේවික්‍රම වෙද ආරච්චි රාලහාමි

— විසින් —

ස්වකීය රහස් ඖෂධ යොග සංග්‍රහ කොට
සපයා තුබුණු වෛද්‍ය ග්‍රන්ථයන්ගෙන් උපුටා ගන්නාලද
මන්ත්‍ර ඖෂධ ආදියෙන් සම්පාදිත කොට,

— පොතුවිල —

වෛද්‍යාචාර්ය වික්ටර්. කේ. විජේවික්‍රම

මහතුන් විසින් සංග්‍රහ කරනලදී.

දකුණු කළුතර විද්‍යාතිලක යන්ත්‍රාලයේ මුද්‍රිතයි.

මිල ශත 50.

"ආරෝග්‍යා පරමා ලාභා."



රූ. ම. පීරිස් මහතා.

පොතුවිලේ පැරණි සිංහල වෙද පරපුරෙන් පැවත එන

වෛද්‍යාචාර්ය වික්ටර් කුඩලාතර විජයවික්‍රම.

මනහර · පැරණි වෙද පරපුරය පොතුවි ලේ
ගරුතර බවට පැමිණවූ **හිමිගෙ පොතුවි** **ලේ**
නිතසර සහෝදර පිය සිසුව පොතුවි ලේ
දවසැර විසුව වෙද සිහරජව පොතුවි ලේ

වික් මැති පියතුමනි! ඔබෙ පා සෙවන ඉ තා
දික් හල් ඇසුරු හල දරු සිසුව හැණ පු තා
වික් ටර් විජේවිකුම් නම් මේ ඔබගෙ පු තා
ලක් සත ලෙස ගොතම් ඔබෙ නමට මුතු ල තා

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.

සංඥාපනය.

[illegible] සිඞ්ඩාරය.

ප්‍රථම භාගය.

ආරෝග්‍යය හා වෛද්‍යශාස්ත්‍රය.

ආරෝග්‍යය වූකලී උපන් සත්වයාට ඇති මහත්ම සම්පත්තියයි. ජීවත කාලය තුළ ජීවිතයෙහි ප්‍රීතිය වින්දනය කිරීමට වගල්වන ඒ මේ ආරෝග්‍ය සම්පත සෙසු සකල ලාභයන්ම අභිභවා පවතින පරම මහෝත්තම ලාභය බව සියල්ල දත් බුදුපියාණෝද "ආරෝග්‍යා පරමා ලාභා" යන්නෙන් ප්‍රකාශ කළසේක.

එම ආරෝග්‍යලාභය වළහා සත්වයා ව්‍යසනයෙහි හෙළන්නෝ සිරුරම උත්පත්තිස්ථාන කොට පවත්නා නානාවිධ රෝගයෝයි. ඔවුන් දුරලා හෙවත් සංසිඳුවා සත්වයා සැපතෙහි පිහිට වන්නේද ඇත්තේය එනම් වෛද්‍ය ශාස්ත්‍රයයි. දෙවියන්ට වඩා අලාමක බුද්ධිප්‍රභාවයෙන් සමන්විතවූ එහෙයින්ම දෙවත්ව යෙහිලා සම්භාවිතවූ තීක්ෂණ ප්‍රඥා ඇති පුරාතන මහර්ෂීන් විසින් කරනලද විවිධ කෘතීන් නිසා පරිපෝෂිතවූද ව්‍යාප්තවූද තද් වෛද්‍ය ශාස්ත්‍රය පරහිත සාධනයෙහි අග්‍රේසරව මැනවින් විරාජ මාන වන්නේය

සර්වඥභාෂිතයෙන් වන ජනසංග්‍රහය වැන්නක් වෛද්‍ය ශාස්ත්‍රයෙන් වන බව

" මුනි විරු දෙසූ සදහම් මෙන් ඇම දුව ස
උව දුරු දුරැර රකිනුව යස්වග මෙවෙස ස
පෙරුදුරු ඉසිවරන් පැවසූ හෝයෙක ලෙ ස
වෙද වරු වෙද සතර පිරුවයි එහි සතො ස "

යන්නෙන් තොටගමු වෙහෙර වහන ගිරා සඳෙස කාරයෝ කීහ.

තන්සම්භවය හා ව්‍යාප්තිය.

ගිරා සඳෙස කාරයන් කියන පරිදි පූජ්‍යාචාර්‍ය ඍෂීන් විසින් මහත් පරීක්ෂණයෙන් හා පරිශ්‍රමයෙන් උපදවනලද ඒ වෛද්‍ය ශාස්ත්‍රයන්ගේද ජන්ම භූමිය අන්‍ය විවිධ ශාස්ත්‍රයන්වල ද උත්පත්තිස්ථානවූ භාරත දේශය මැයි. මෙසේ පහළවූ තද්ශාස්ත්‍රය පසුකාලයෙහි පර්‍ය පාලයන්ගේ සද්භාවය නිසා පෙරපර

දෙදිගම එකසේ ව්‍යාප්තව ගියේය. එසේ ව්‍යාප්තවූ මේ ශාස්ත්‍රය මහ මුහුදු තරණය කොට ලක් දිවයිනටද සම්ප්‍රාප්තවූයේ මෑතක නොවේ. අති දූරාතීතයෙහිමය. වේදශාස්ත්‍රඥ ගුණවත් භාරතීය බමුණු මහල්ලන් විසින් ප්‍රලාප මුඛයෙන් රකුසන්යයි හංවඩු ගැසුණු විශිෂ්ට ශිෂ්ටාචාර සම්පන්න අනභිභවනීය සිංහලයන් අතර 'අර්ක ප්‍රකාශ' කාර ලංකේශ්වර රාවණයන් වැනි ග්‍රන්ථ නිෂ්පාදකයන්පවා සිටීමෙන් ඒ බව මොනවට පැහැදිලිවේ.

සිංහල වෙද සතර.

මෙසේ ඉතා පුරාතනයෙහි ලක්දිව ව්‍යාප්තවූ වෛද්‍යශාස්ත්‍රය මැනවින් හැදෑරීමෙන්ද එයට අභිනව ග්‍රන්ථයන් කිරීමෙන්ද සිංහලයෝ එය ස්වජාතික වස්තුවක් කරගත්හ. එසේම ඇතැම් සිංහල රජවරුන් එය හැදෑරීමෙන් වෛද්‍යශාස්ත්‍රය රාජකීය ශාස්ත්‍රයක් කළහ. මෙසේ රාජකීය ස්වජාතිය වස්තුවක් වශයෙන් සම්භාවිතවූ මේ ශාස්ත්‍රය සකලාඞ්ගයන්ගෙන් සම්පූර්ණව ගියේ පසු කාලයෙහි සිංහල වෙද සතරයයිද හඳුන්වන්නට වූහ. එහෙත් මෙහිදී කියයුත්තේ නම්:- සිංහල වෙද සතර බවට පෙරළුණේත් අතීතයෙහි ලක්දිව ව්‍යාප්තවූයේත් ආයුර්වේදය නොවේ. මහර්ෂිවර අගස්තීන්ගේ වෛද්‍යශාස්ත්‍රයයි. එහෙයින් අපගේ ස්වජාතික වෛද්‍යශාස්ත්‍රයෙහි උත්පාදකයා වශයෙන් අගස්ති මහර්ෂින්ට ගෞරව කළ යුතුය.

අගස්ති මහර්ෂි නම් කවරෙක්ද?

සිංහල වෛද්‍යශාස්ත්‍රයෙහි ආදිම උත්පාදකයා වන අගස්තීන් ගැන මඳ හැඳින්වීමක් කළයුතුසේ පෙනේ. මහර්ෂි වශිෂ්ඨ, මත්ස්‍ය දෙදෙනාගේ සහෝදරවූ මේ අගස්ති තෙමේ භාරතයෙහි ජන්මලාභය කළ කෙනෙකි. දිව්‍යඥානයද පරදවන මොහුගේ අප්‍රතිහත බුද්ධිය සැලකූ වියත්තු මොහුගේ උත්පත්තියට දෙව කථාද මිශ්‍රකළහ. එසේම මොහු පාණිතලයෙන් සාගර ජලයද ගත් කෙනෙකු කොට සැලකූහ. එසේම මොහු කලසයක උපත් බව කියමින් මාතෘ කුක්ෂියක ඉපදීමෙන් වන්නට තුබුනු අපවිත්‍රත්වය බැහැරකළහ. ඒ සැටි නොවේවුවද අගස්ති සෘෂිවරයා නම් භාරතයෙහි උපන් කුශාග්‍ර බුද්ධිමත් ගෞඩ දේශයෙහි වාසය කළ මහා වෛද්‍ය ශාස්ත්‍රෝත්පාදක රුෂිවරයෙකි. කියන ලද මැයි.

බ්‍රහ්ම වෛවර්තයෙහි:-

“ අප්‍රපෙත භාස්කරෙ ඝත්‍යාං, ශොෂපුෂ්පෙත සම්ප්‍රීතිර් දිශෙ තඃ
අත්‍යං දද්‍යුර්ගසත්‍යාය, ගෞඩදෙශ නිවාසිනඃ” යි.

තවද මොහුගේ මව්පිය දෙදෙන මිත්‍රා-වරුණ නැමැත්තන් බව:-

"මිත්‍රාවරුණයොඃ පුත්‍ර! කුම්භයොනෙ! නමො ස්තු තෙ"

යන නාරසිංහ චම්පූවෙන් පෙනේ. එසේම අගස්තිනු විසින් ආතාපි, වාතාපි නම්වූ අසුර ප්‍රධානයන් නැසූ බවත්, මුහුද වියළෙවූ බවත්:-

"ආතාපිර් භක්ෂිතොයෙන, වාතාපිශ්ච මහාසුරඃ
සමුද්‍රඃ ශොෂිතොයෙන, සමෙ'ගස්ත්‍යඃ ප්‍රසීදතු"

යන සූක්තියෙන් ප්‍රකටවෙයි.

මෙසේ පියතුන් විසින් මහාවීරයෙකු ලෙස හා දේවත්වයෙන්ද සම්භාවිතවූ මේ අගස්තීන් විසින් උපදවන ලද්දේ, සර්වාඞ්ග සම්පූර්ණ වෛද්‍යශාස්ත්‍රයකි.' අගස්ති වෛද්‍යය' යන නමින් ව්‍යවහෘතවූ ඒ මේ වෙද සතර ආයුර්වේදයට වඩා ප්‍රත්‍යක්ෂ අත්දුටු ඖෂධ යොගයන් ගෙන් සමන්විත විය. එහෙයින් අගස්ති තෙමේ වෛද්‍ය ඥානයෙන් සකල ආයුර්වේද කාරයන් මුළුගැන්නුවෙකි. වෛද්‍යචක්‍රවර්තිවූ අගස්තීන්ට ළං විය හැක්කෙක් ආයුර්වේද කාරයන් අතර එකල්ද නොවිය. මෙකල්ද නැත්තේය. ගුලි, කල්ක, දෙක අගස්ති වෙදකමෙහි ඉතා ප්‍රධානස්ථානයෙක සිටී. අගස්තීන්ගේ ගුලියකට සමාන ගුලියක් ආයුර්වේද කාරයෝ කිසිතෙනකුත් නුදුටුවෝය. මෙසේ ආයුර්වේදය පරදවා සජීවාභාසශ්‍රීයෙන් භ්‍රාජමානවූ අගස්ති වෙදකමෙහි තෙජස හා කීර්තිය කාලයේ වැලිතලාවෙන් යටවෙන්නට වූවා මෙන්ම එයම ප්‍රභව කොට ඇති සිංහල වෙද සතරද පළමුව උත්සාහශ්‍රීයෙන් බැබළී බැබළී පැවත කලින් කල ඇතිවූ දරුණු රාජ්‍යවිප්ලව සංග්‍රාම ආදී ජාතික පරිහානි හේතු කොට ගෙන අඳුරුවන්නට පටන් ගත්තේය. එහෙත් සිංහල වෙදකම සම්පූර්ණයෙන් මූලොච්ඡින්නව ගියේ නොවේ. මිණි මුතු වලට්ද වඩා අගනා නම් ඇති ප්‍රත්‍යක්ෂ ගුණදායක බොහෝ ඖෂධ යොග සිංහල වෛද්‍යයෙහි නෂ්ටාවශිෂ්ටයන් ලෙස මෙකල්ද දක්නට ලැබේ. එසේ පවත්නා ඖෂධ යොග විරල නිසාද දුර්ලභ නිසාද ප්‍රත්‍යක්ෂ ගුණදායක නිසාද ඒවා රහස් බෙහෙත් ලෙස ප්‍රවේශම් කරන්නටත් අනුන්ට පවා නොදී ආරක්ෂා කරගන්නටත් සිංහලයෝ පටන්ගත්හ. ඒ සිරිත ගැන ඇතැමුන් නින්දා කරතුදු පාලුගෙයක් සේ පැවති අතීත යුගයෙහි එම සිරිත නොපැවතුනා නම් සිංහල වෙදකමේ හැම නෂ්ටාවශිෂ්ටයක්ම පරහස්තගතව අවසන් වන්නට තිබුනි. එ නිසා ගෘහස්ත ලෝභයෙන් වුව ඒවා ආරක්ෂා කළවුන්ට වර්තමාන ජනතාව කෘතඥ විය යුතුය.

දැන්වූ කලී ඒ සිරිත වෙනස් කොට ඒ එවිහා ඖෂධ යෝග එළිපහළි කල යුතු වෙලාව බව සතුටින් කියනු රිසියෙමි.

'මහෞෂධ සිඩිසාරය' නම් වූ මේ ග්‍රන්ථයෙහි ප්‍රථම භාගය එයට මූල පිරීමක් වශයෙන් අප අතින්ම සිදුවීම නොවැතිය හැකි තරම් මහත්ම ප්‍රීතිදායක කාරණයකි. විශේෂයෙන් මේ ග්‍රන්ථ නිෂ්පාදකයා කොලෙල් පොතුවිලේ ශ්‍රී ඉන්දජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ ශිෂ්‍ය සොහොයුරු දෙන් පිලෙක් කේ. විජේවික්‍රම වෙදආරච්චි රාලහාමි විසින් දහස්වරඅත් දැකීමෙන් භාවිතා කරන ලදග්‍රන්ථවශයෙන් සකස්කරනලද ප්‍රත්‍යක්ෂ ඖෂධ යෝග සංග්‍රහ කිරීමෙනි.

එසේම මේ භාණ්ඩයෙහි ඇත්තේ ඖෂධ යෝග සීමා සහිත ගණනක් වුවද මෙහි දෙවෙනි තුන්වැනි භාගවලින් අප අතරේ සැඟවීතිබූ සකලාඞ්ග සම්පූර්ණ සිංහල වෛද්‍යශාස්ත්‍රයම ශාස්ත්‍රාර්ථින් අතට දෙන්නට වෑයම් කරම්හ. තවද, පරාර්ථයනකා කරන ලද මේ ග්‍රන්ථයෙහිහැම යොහනක් සම්පූර්ණ සත්‍යයෙහිත් අව්‍යක්ත භාවයෙහිත් පිහිටා කරන ලද බැවින් ඒවායින් ලැබෙන අත් දැකීම් සියල්ලන්ටම ප්‍රත්‍යක්ෂව පරීක්ෂණය කර බලන හැක අප ගත් සත් ප්‍රයෝගය අනුගමනය කරන සෙසු භවත්හුද සිංහල වෙද සකර නගා සිටවන්නට යත්න කෙරෙත්වා.

මේ පොතේ ශුඩි පත්‍රයක් පොත අවසානයේදී කෙරෙන බව මතක්කරමි.

මෙය නැවත මුද්‍රණය කිරීමේ සියළු අයිතිවාසිකම් වෛද්‍යවාසී. වික්ටර්. කේ. විජේවික්‍රම වන මා වෙතම තබා ගන්නාලදී.

මම,
වි. කේ. විජේවික්‍රම.

1939 ජූලි 10 දින.
කළුතර දීය.

පොතුවිල
මන්ත්‍රෞෂධ සිද්ධසාරය.

---

1 රාජවෛශ්‍යාවට.

කොංකුන්, සුදුහඳුන්, ගෝරෝචන, එලකිරෙන් තිලකදී රජුන් ආදි ප්‍රධානීන් දකිණු. තමා කෙරෙහි සතුටුවේ.

ඊට මන්ත්‍රය- ඕනාමඃ ස්වාමිදේවාය සකල සඟද සසකඩම් සහ හර ත්‍රිභුවන ජන .මම මගීනම් උත්සාන්සිත කුරු කුරු ඉසඹ්‍ෂකොදණිඩම්රකුසුම්බාතාය හන හන ස්වාහා— මෙසින් 1000 වරක් ජපකොට ගතයුතුයි.

2 රාජවෛශ්‍යාවට ශ්‍රියාදේවි දිෂ්ටියක්.

ඕං සුරදිෂ්ටි අසුර දිෂ්ටි ශ්‍රී ලංකා දිෂ්ටි ලංකා පතිදේවි දිෂ්ටි ආකාස දිෂ්ටි පොළොව දිෂ්ටි ජල දිෂ්ටි ජලභූමි දිෂ්ටි ඉරදිෂ්ටි තිල දිෂ්ටි සඳ දිෂ්ටි වණි දිෂ්ටි නවග්‍රහ දිෂ්ටි ග්‍රහගවංචලිත ආවේශ ආවේශ දිෂ්ටි දිෂ්ටි පේ ශ්‍රියාදේවි එන් එන් එන්මෙන්ගි ස්වාහා.

රාජවශ්‍යාවේ දූතනා.

ඕං නමඃ සිවාය මසිවාය සිවාය වාය නම්සිය ඕං සලීමොහනි වශිය. මෙම ශ්‍රියාදේවි දිෂ්ටි මන්ත්‍රයෙන් අවෙර්රාසියක් රත්තැඹිලි තෙල් මතුව තැවත මන්ත්‍රදූතැනින් දගැස් මතුරු බොහිවාකයක් ඉලදි සුවඳදුම් මල් පහන් ඇතුව පංචවණි මලින් සහ ලද පස් මලින් මල්තටුවක පුරවා ඊ මැද තෙල් තබා ජීවංකොට රත්‍රං සුර යක අසුර පිරිසිදු ලෙස තබාගත යුතුයි. මෙසේ ජීවංකරගත් තෙල රාජවෛශ්‍යාවට හිසේ සහ නළලේ පාවිච්චිකළ යුතුයි.

3 ත්‍රිලෝක වෛශ්‍යාව.

කෙලවර, කොණ්ඩරකුඹිඹිය, විෂ්ණුක්‍රාන්තිය මුල්, ගෝරෝචන, කාංකුමපසු, සුදුහඳුන් මෙකී ද්‍රව්‍යසම්භාගව පෙණ මුණිකොට කපුරු මිශ්‍රව නළලේ තිලකදී යනු. ත්‍රිලෝකවැස්සෝම ප්‍රියවෙත්.

ඊට මන්ත්‍රය- ඕං කාළ සංබරී ජාලිනී මාලිනී සර්ව ස්ත්‍රී පුරු වශම්කාය ස්වාහා- යන මේ මන්ත්‍රයෙන් 108 වරක් ජප කොට තිබා තිලක දෙහාවිට 100 ක් වරක් මතුර ගනු.

4. සර්වලෝක වශිය

පිඟුණුබ්‍රාහ්මිය, කෝමාරිකාබිඹිය, මහබැබිල, සහදේවින සුදුහඳුන්, කොකුම්, දමිවා සමව ගෙණ නානා ස්ත්‍රියෙකු ලවා ඇල් පැනින් අඹරවා ගුලි කොට සෙවන වියලා මතුව තිලක දෙනු. සර්වලෝක වශ්‍යවෙයි. ඊට වශීබාමන්ත්‍රය. 1. කොටසනට තිශම මන්ත්‍රය. මීට යොදනුයි.—

5. දුෂ්ට ස්ත්‍රීන් වශකරන්ට.

කළුකැම්මෙපිය, වදකහ, හෝවිටන්, බෙලිකොල, කොකුම්, සහදේවිත අං කුඩු සමව ගෙණ චූර්ණකොට තබා තමනට ලෙහින් තිලක දෙනු. දුෂ්ට ස්ත්‍රී වශග වේ—

6. නව ස්ත්‍රී වශ්‍යාවක්.

කැමති ස්ත්‍රිය සිත තබා මෙහි පහත මන්ත්‍රය සුඛසර්වනයක දිනකට 1000 වර බැගින් තුන් දිනක් ජපකලේ මසනාදී තම්බා වශග ඇව එයි— මේ යෝග දෙකටම යට දක්වූ මන්ත්‍රයමයි—

7 සනාථවූ නාරසිංහ බීජ මන්ත්‍රය

ඕන් නමෝ නාරසිංහාය හිරණ්‍ය කශිපුවක්ෂස්ථලවිදාරණාය ත්‍රිභුවන ව්‍යාපකාය භූත ප්‍රේත පිශාච ඩාකිණී කුලෝන්මූලනාය ස්ථම්භෝද්භවාය සමස්ත දෝෂාන් හර හර විෂ රවි ශර පචපච හන හන කම්පය කම්පය මථ මථ හ්‍රීං හ්‍රීං හ්‍රීං හුං හුං ඵට් ඵට් ඨඃ ඨඃ එහෙිව හිරුද්‍රාඥපයතිස්වාහා—

නාරසිංහස්‍ය බීජනතු සන්‍යෘද්ධජ්වරිතංහරෙත්
ඩාකිණී ප්‍රේත භූතානාං නාශඃ සූර්යෝදයෙ යථා—

යනු හෙයින් මෙම නාරසිංහ බීජ මංත්‍රය වනාහි ශාකිණී ඩාකිණී ආදී ප්‍රේත දෝෂ නමැති අන්ධකාරයට සූර්‍යාලෝකය වැනිසි. එසේම දුෂ්ට උන්මාද බාලයන්ගේ සියළු උපද්‍රව දුරු කෙරෙයි— අබ 108 විට මතුරු ගෙයි සහ වටපිට ඉසිනු. ගෙවල ප්‍රේතාදීන්ගේ දෝෂ දුරුවේ මෙය තල්පත ලියා 108 විට මතුර කරේබඳිනු. විශරු බළු විෂ දුරුවේ. මේ මන්ත්‍රය අපවිසින් හාවිතා නරඅත්දුටු මංත්‍රයකි සැනහොනාකරනු. (ඉන්ද්‍රජාලවිද්‍යා සංග්‍රහ)

8. වෙලඳාමෙන් ජය ලැබීමට ශ්‍රී මොහණ ධූපය—

කිකිරිඳිය, වදකහ, ජටාමාංස, හල්දුම්මල, හිඟුලංකාල්, මල ශාලෙ සුදුහඳුන් සමවගෙණ කුඩුකර පහත මංත්‍රයෙන් 1000වරක් මතුරා උදය සවස දුංදෙනු. කඩ සාප්පු ආදිය දියුණුවේ. ඕං අං ආං ෆ්‍රං ඊං උං ඌං ඍං සං එව් ඕං හිංසක්‍රාමෙමාහය—

9 සර්ප මූෂික මකුණු ආදීන් එලවා දැමීමට,

අජීගන්ධ ඵලංපුෂ්පං ලාක්ෂා ශ්‍රී වාසගුග්ගුලුම්
දේවදාරු රජනී මූලබහල්ලාතක විඩංගකම්
ධූපං සර්ජරසෝපේතං ප්‍රදද්‍යං ගෘහමණ්ඩපෙ
සර්පාශ්ච මත්කුණා මූෂා නශ්‍යන්ති දිශෝ දශ

යනුහෙයින්:- කුඹුක්ගෙඩි සහ මල්ද, ලාකඩද, සුදු හඳුන්ද, ගුගුල්, හා හෙලකටුරොළු මුල්ද, බදුලල ඇට සහ වලගසාල්ද, හල්දුම්මල සමග කුඩුකර දුංදීමෙන් ගෙවල්වල හැසිරෙන සර්ප මූෂිකාදීන් හැතිවියයි (භාමරත්න)

10. ගෙවල්වල ඉන්න සතුන් පැන්නීමට

ලාකඩ, සිරිවටු, ගුගුල්, හෙලකටුරොළුමුල්, කුඹුක්ගෙඩි සහ මල්, බදුල්ල ඇට, වලගසාල්, දුම්මල මේවා සමව ගෙණ කුඩුකර ගෙවල්වල දුංදීමෙන් සියළු විෂඝෝර සර්පයන්ද මී, මකුණු, කැරපි ආදී සියළු සතුන් දුරුවේ මෙය බොහෝසේ තතා ඉන්දියාවේ බ්‍රාහමණවරු කුඩාවින්වල අසුරා විකුණති.

[illegible]ව මංත්‍රය— පුලෝවංබබ පශ්චිමෙ කා[illegible]බබ උත්තරේ රුද්‍ර බඝ —[illegible]සිණේ යමබබ පාතාලේ වාසුකෙබබ එනිශහශ්‍රෙබබ හුං අංගුෂ්ඨාය නමඃ—108 වරක්.

11 නයා පැන්නීමට

අඳුවැලේ කොළ පොඩිකොට නයා අසල විසිකරනු. නයා නොසිට දුවයි. මේ වැල්ජාතිය ගෙවතුවල වවා තබාගත යුතුයි.

12 සස්‍යාරක්ෂාවට (ධාන්‍ය)

සුදුවැලි සහ කොල අඹ, පහත මංත්‍රවලින් 108 වර මතුරා කෙත්‍රය (කෙත) මැද දැමීමෙන් සස්‍යවලට විනාශකරණ මැස්සන් ආදී සියළු සතුන් දුරුවේ.

මන්ත්‍රං: සුරේශ්‍යා බල ජඃ ජඃ පරිඑඃ සිසිරි සිසිරි ස්වාහා නිතාමසනුණංත— මෙය සෑහ නොකරණු.

13 ශස්‍ය වැඩීමට. (වී, කල, මෙනේරි කුරක්කන් ආදිය)

පුෂ්‍ය නක්ෂත්‍ර සංයෝගෙ චන්දනේ ගිහ වාසජම්
ශස්‍ය මණ්ඩපෙ පෙ[illegible] ශස්‍ය වෘද්ධිර්භවෙද් ධ්‍රුවම්

පුෂ්‍ය නක්ෂත්‍රයෙන් බුළු ගසකට නමස්කාර කොට මුලක් ගෙණ ධාන්‍යකොටේ යටකරතබනු වැඩිවේ සැකනැත(භාමරත්න)

14 ස්ත්‍රීන්ගේ පයෝධර වර්ධනයට හා දෘඪත්වයට

මෙතලං වචා දෘඪ ම්හාලුකා සිද්ධං සිද්ධාර්ථ ජංලෙපනං ...ගිහාංගනා
නාරි කුචෞ වාරු තමරශ්ච ජීහනා කුචසීරාද ශ්‍රණ ... ප්‍රදපො:

වදකහ හා දෙළුන්ලෙල්ල තලතෙලින් අඹරා අබයෙලෙන් පැසවා පයෝධරයන්හි නිතරනිතර පිනද්නක් ගෑතල ඉපාසොදීන් ලොකුවෙනවා පමනක් නොව දෘඪවීමද කෙරේ. (භාෂ්‍යයන)

15. බාලයන්ගේ සහ ගැබිනින්ගේ භූතග්‍රහ නිවාරණයට

බිල්වමූලං දෙවදාරුං ගොශෘංගංච ප්‍රියංගුම
මාජ්ජාරස්‍ය මලං කුෂ්ටං වංශත්ව ගජමූත්‍රකෙ:
වීෂ්ටචා ධූපො නිහන්ත්‍යාශු ග්‍රහභූතජ්වරාදය:
ඩාකිනීරාක්ෂසා: ප්‍රෙතා: පිශාචා බ්‍රහ්මරාක්ෂසා:
එකාහිකොද්‍යා නියශ්ච ජ්වරොනශ්‍ය නිත්‍යක්ෂණාත්.

බෙලිමූල්, දේවදාර, කොතුරුබැද්ද, පුවඟුමල්, බලල්වසුරු සහ මේ සියල්ල එළුමූත්‍රයෙන් අඹරා දුංදීමෙන් බාලයන්ගේ හා ගර්භිනීන්ගේ සියළු භූත ප්‍රේත පිශාචාදීදොෂ හා උනද දුරුවී යන්නේය—ඕං ශ්‍රී විතං භාපෙ ඨඃ ඨඃ ස්වාහා—මේ මන්ත්‍රය [illegible] දුං අල්ලනු [illegible]

16 බාලයන් සහ ගර්භිනීන් ආරක්ෂාවට

ගර්භිනීන්ගේ අත්පා ආදී රූජාවට සහ ගැප් ආරක්ෂාවට බෙවිල මුල් කලං 6 යි බෙලිමූල් කලං 4, ඉඟුරු කලං 2 මේවා මෙසේ කිරි යෙන කෂාය කර රත්හල එලකිරි පතක් පමණ කෂාය පත බාගයකට දමා වලදිනු.

17. සොරභීය නැතිවීමට

පුර පක්ෂයෙහි පුෂ්‍ය නැකතින් එල බලීදමුලක් උදුරා නිදියන ශයනයෙහි ඉහඉද්දර බඳිනු. සොරුන් නොපැමිනෙයි—

18 යක්ෂ භූත ප්‍රේතාදී දොෂ නාශයට

ඉරිද දිනයක මාරාමුල් සහ කොල ගෙණ. බතාදුහුණු බෙට් බටුලොම්, බලලුන්ගේ සහ බල්ලන්ගේ මසුරු, ගොම, [illegible] ගම, එලබලිද මුල් සහ මේවා අඹරා අබ තෙලින් කාරාගෙන ඕං නම: ස්වශාන්තං ශිනොගුනාදී පලායනා කුරු කුරු ස්වාහා- යන මන්ත්‍රයෙන් දහස් වරක් මතුරා අමනුෂ්‍යදෝෂ ඇති ගෙවල්වල අල්ලනු. රාක්ෂයෝද, යක්ෂ ප්‍රේත පිශාචාදී හුද පලායෙයි. දෝෂ: ශාන්ති ශ්‍රී වඩයි.

19 භාග්‍යලාභය.

රැහිය කොල (රැහමලී) කොලපාලා තුවාලේ මතුපිට තබා බැඳ ඇල් වතුරෙන් තෙමනු. තුන්වේලේදී තුවාල පෑහී ගුණවේ, රැහමලී නම රැ මහමාලී නමැති මල් ගස් වර්ගයකි

20. විවාදයෙහි ජයග්‍රහණයට.

පුරපක්ෂයේ මූලසිරසේ නකතින් මොණරකූඩිමිතිය මූලක් ගෙණ හිංහමෝ විශ්වරූපාය අමූකාස්‍ය අමූකෙන විජයං කුරු කුරු ස්වාහා, යන මංත්‍රයෙන් දසදහස් වරක් මතුට අතේ හෝ ඉසේ පැලඳ යනු— ජයලබයි— අමූකාස්‍ය. අමූකෙන නිදෙනැනට වසඟ කාරණ තැනැත්තාගේ නම හා ජයගන්නා තැනැත්තාගේ නාංදෙක සඳහන්කර මතුරණු.

21 පිට ගිය අය ගෙන්නීමට.

මිනී ඔළුවක ගෝරෝචන වලින් හිංහමෝ ආදි පුරුෂාය අමූං[illegible]නාශීණං කුරු කුරු ස්වාහා යන මංත්‍රය සහ නමත් ලියා [illegible]සැ[illegible]තක් මතුර කිහිරි ගිනි අඟුරුවලින් තවනු. (අමූංනං නි[illegible]ගිය අයගේ නම කියා මතුරගනු.) එගා පැමිණේ.

22 දීර්ඝායු ලබන්ට.

එල කපුඇට පතක් පමණ ගෙණ උදුගාතපස් සිහින් කර ගා ගෙණ කෙසෙල් පතුරක්පිට තබා උෂ්ණෙන් රත්කරවා කෙල් බඳුනකට පෙරාගෙණ මෑ තැකතා ඇතිකාල්හි ඉස බඩ ගුඩකොට බුදිනු. එසින් ගුණ සියක් ආයුවේ. ශුභ ග්‍රහයෙක් ස්වාමීගේ ලග්නය ද්‍රුවහොත් 95 ක් ආයුවඩා ලග්නාධිපතියා හා සතුරෙක් සිටිය හොත් හෝ දුර්බලහොත් කියනලද එල අඩියක් බැව් දතයුතුයි. සර්වරෝග හංගහාරත්. රූප හා බලවඩයි. සත්‍යයි.

23 සම්පත් ලැබීමට.

අනුර නකතින් බෙලි පිළිලයක් රැගෙණ දුම්අල්ලා ගෙදර ගෙණවිත් පලේ හෝ පියසක හෝ ඉදිරිපිට ගසා තිබනු. එයින් ලබන පල නිබඳ ධරීසගේ ඇල්මවෙත්. එද්වයාමෝ ඒ සම්පයෙන් ගමන්කරයි. නම්ං ගිය සාමයුතු ඉෂ්ටවෙයි. ඉසුරුලැබේ නොයෙක් ආබාධ දුරුකෙරේ. අමනුෂ්‍යදෝෂ දුරුවේ. සතුරුභය නොවේ. සූතියන්දෝෂ ගෙදරට නොඑයි. අප්‍රමාණ මන්ත්‍රසංගෙ වැඩිවේ. විපාක ඇතිවේ. සැකනොවෙනු.

24 ග්‍රහ පීඩා දුරු කිරීමට

කලවරමුල්, කළුඅත්තනමුල්, එලනැබෝමුල්, එලඊතනමුල්, නුගමුල්, බෝමුල්, දැමිණිකොල, අඹකොල, අත්තික්කාකොළ මෙම, මැටිබඳුනක බහා ඒව දීකිරි, උඩු, මුං, තල, මෑ, වී යන ඇට වර්ග හා ගෝමුත්‍ර, ගෙල අඹ, කුසතණ, සුදුහඳුන්, මීපැනි, යන මේවද දමා සතකුරුද හැන්දෑවක හිනා මෝ භාෂ්කරාය, අග්නිකාය × කළීග්‍රහාණාං පීඩානාශනං කුරුකුරු ස්වාහා යන මිනු යෙන් දහස් වරක් මතුරා බෝගසක්යට වලලනු. ග්‍රහ උපද්‍රවද, මණයවූ දිළිඳුබවද පහවී බොහෝකල් ජීවත් වේ. (කාම්රත්න)

25 ගවමහිෂාදීන්ගේ කිරිවැඩීමට

ඕං හ්‍රුං කාරිණී ප්‍රශව ඕං ශීතලම්, මේ මන්ත්‍රය සීහිකරමින් තන කොල ආදී ආහාර කවනු බොහෝ කිරි ඇතිවේ. (කාම්රත්න)

26 ශ්‍රැතිධර හා පණ්ඩිතබීමට පථ්‍ය ප්‍රකාශ (කාම්රත්න 95 පිට)

පථ්‍යා වචාකණගුණ්ඩී සෙන්ධවංමරි වංචවා
ශීක්‍රංප්‍රතිඵලං චූර්ණං වාෂිංශති ඵලංසෑතම්
ඝෘතාවිෂතුර්ගුණං ක්ෂීරං දත්වා සජීංවිපාචයෙත්
ඝෘතශෙෂං පිබෙන්නිත්‍යං වාණිමෙධාසමෘති බුධි

යනුහෙයින්:- අරළු, වදකහ, තිප්පිලි, වේලිච්ච ඉගුරු, සෛන්ධ ලුණු, ගම්මිරිස්, වෙනිවැල්ගැට, මුරුංගාමුල් යන මේවා චූර්ණකොට පලම් බැගින් ගෙණ ගිතෙල් පලං විසිදෙකක්ද ගිතෙල්මෙන් සිව් ගුණයක් එළකිරි දමා ගිතෙල් ප්‍රමාණය ශෙෂවනතුරු පිස උදේ සවස කලත් තුනබැගින් වලඳනු ධාරණශක්තිවේ. (කාම්රත්න)

27. කටහඬ වැඩීමට

ශුණ්ඨිවශතීරාජමව සෞවර්චල සහ සංයුතා
කොංකිලස්වර එවස්‍යාද් ගුටිකාභුක්තිමාත්‍රතඃ

සිඹිඟුරුචූර්ණය සීනි මීපැණි සමග ගුලිකාකොට ගුලිගසා අනු ගව කාරණු. එම ඇසිල්ලහාදී කොවුල්නද හා සමාන නාද ඇතිවේ.

28, ජවම

තිශ්‍රීණි මූලචූර්ණතාතු තිලතෛලෙන යොලිතෙන්
කණ්ඨශුඩිහීවේතානස්‍ය කින්නරෙරෙ සහගීයතෙ

යනුහෙයින්:- තිකමුල්චූර්ණය වතාහි තලතෙලින් යමෙක් ලේහ කරත්ද ඔහුගේ කණ්ඨශුද්ධියවීමෙන් කිඳුරන් හා සමාන නාද ඇතිවේ.

× මෙතනට ඔබ අයගේ නම කියනු.

29 සෙලවෙන දත් සවිවීමට

යම් විඩුචාජ්‍යාප්ලුතිකාමූලංවා හශම්ාරජම්
චලද්දන්තා දෘඪායාන්ති ප්‍රතොෂ්‍යකාං දන්තධාවනාත්

යටුමෙහසින්: සියඹලා, කාන්සා, පිල, කෑකිරිය, ගහ ඹේ කොසී ජුල්ජාතියකින් හෝ දත්මැදීමෙන් ඉතා ශක්ති සම්පන්නව දත් සවි වෙනවා ඇත. (භාමරත්න 100 පිට)

30 පාෂාණං ඇදී හැමවීමට

ශෙවතාපරජීතා මූලං පිත්වා දුග්ධෙනමාතවඃ
සර්වාවරසූඩි විෂංගතානි උදරස්ථාන සංශයඃ

කොලකටරොළුමූල් එලකිරෙන් අඹරා එයින් පානය කර වනු. පාෂාණං ආදී බඩටගිය සියළු විෂනසති. සැකනැති. ඊට මන් ත්‍රය-හිංනමෝ භගවතෝ උඩ්ඩාමරෙශ්වරාය කුසුදුකාමෘතම්ජිත ජටාය ඨඃ ඨඃ ස්වාහා මෙය සිතිකාර දෙනු.

31 සියළු සපීවිෂට

ස[illegible]වකිඹුල ගෑෂ් කොල සමග මූලල්පොතු කොටා පුනුකර බඳ[illegible] [illegible]ණකිරිල්ලගෙන් කොළ සමග කරටි සහ එම පොතු සමව ගෙන කොටා සුනුකර සපීනින් දෂ්ටකළ මුඛය වසාද ඉදිමුම ඇති පොළද වසා බඳිනු.

32. සියළු සපීවිෂට

දධිමධු නවනීතං පිප්පලීශෘඩගවෙරම්
මරිචමපිච කුෂ්ඨං චාෂ්ටමං සෙන්ධවඤ්ච
යදි දශතිපරෝ ෂජනාෂකොටවං පුෂ්පී
යමසදනගතඃ සන්‍යාදනා ශෙතාතාප්සමෙණ්න

යතුහෙසින්:- දීකිරි, මීපැනි, අළුත් ගිතෙල්, තිප්පිලි ,වෙලිවව ඉගුරු, ගම්මිරිස්, සුවඳ කොට්ටම්, සහිඳළුනු, සමග දෙනු. අනෙකාගවිෂයෙන් මලවුන්පවා එවෙනුණයෙහි නැගිටිත්.

33 යාව එහෙක්

ගොංමූලෙ ත්‍රුනීරමූලෙනුවීං පුරාණෙන ඝෘතෙනවා
හරිද්‍රා සාමාත්‍රෙණ විෂංගනානි වරංවරම්.

ගොංමූත්‍ර හෝ හරමූත්‍ර පරණගිතෙල් සමග හෝ වෙනුමැල්ලැට තාණාගසාර මෙහින් යමක් දමා හෝ පානය කරවනු. ශරීරගත සියළු විෂ ඇසිල්ලකින් නසයි (භාමරත්න)

34 උනබැස්සීමට (ශරීසංහිතායෙයි)

ඕං නමෝ භගවතේ වජ්‍ර පාණයෙ මහා සුෂෙනාධි පතයෙ ඕං සර්ව ගෘහ [illegible] ගෘහණි ජඩීජඩී ශිරෝ මුඤ්ච මුඤ්ච හෘදයං මුඤ්ච මුඤ්ච උදරං මුඤ්ච මුඤ්ච කටිං මුඤ්ච මුඤ්ච උභරූං මුඤ්ච මුඤ්ච හස්තෞ මුඤ්ච මුඤ්ච ගාත්‍රාණිමුඤ්ච මුඤ්ච ඕං හුං හුං හුං ඵට්. අමුකශ්‍ය සර්වජ්වරං නාශය ස්වාහා. තල්පතක හෝ මේ මන්ත්‍රය ලියා අමුකස්‍ය කී තැනට නම ලියා 108 විටක් මතුරා උන ඇති අයගේ හිසේ බඳිනු. උන බසී.

35 කැපුනාට මන්ත්‍රය

නමෝ කන්නාචාරුන් වානාචාරුන් වාත මූකක කොලචාරුන් ශඩී ඍවට්ටු චාරුන් ඊශ්වර නාරායනෝ පූට්ටු පූට්ටු ඒ ස්වාහා— කැපුන තැන අල්ලා වතුර මතුර වක්කරනු.

36. උළුක්කුවට

ඕං නමෝ පණි උරුලාපන්තෙනන්ඩි උරුලා අපෙ[illegible] උත්තම සංඝන් වහන්සේගේ ශ්‍රීපාද පද්මය උළුක්කු වැටුනු [illegible] යෙන් තෙල් උළුක්කු මල් උළුක්කු දුවන උළුක්කු පනින [illegible] නහර උළුක්කු නාලක්කට්ටි නීලක්කට්ටි ස්වාමියාගේ ඉලිදී ඉබිල ඒස්වාහා— උළුක්කුවට තෙල් මතුරා ගා අදිනු. අත්දුටුවයි.

37. ලේහිඳුන් පාචනයට

නමෝ නාරායනෝ බ්‍රහ්මානි ඊස්වරී මූරු මූරු ඒ ස්වාහා. කැද වතුර හෝ තේවතුර ගල්කන්ඩ දමා මතුරා දෙනු—

38, ගින්නෙන් දූවාට

නමෝ ශ්‍රී භගවත් ශ්‍රී දේවභගවත් ශ්‍රී බුඩරාජනෝ ස්වාහා—
මෙයින් 108 වරක් තෙල් මතුරා ගානු ගුණවෙයි පොල් කිරෙහි එණු දියකරද එසේ කරනු.

39. ළදරුවන් ආරක්ෂාවට

නමෝ ඉරන්ඩ ශිවකාල භගවතෝ අපිපච්චකාලී ඉරිකට්ට උඩත්තේඑන් කාසිම්රකච්චු පෙරිය උඩ සෙල්ලුත් කච්චු පූච්චු නමඃ. රෙද්දතොන්ගලට 108 විට මතුරා ගැට ගසා තබනු—

40. දත්කැක්කුමට මන්ත්‍රය

ඕන්නමෝ ඉරිදෙවියන්නෙත් ගස්සාය සඳදෙවියන්නෙත් ගස්සාය දත්වෑශ යව්ව ගස්සාය ගල්කැට 108 මතුර පිහ දමනු.

41. සාව එකක්

නමෝ දිත්තෑ ඒසවාහා. වතුර හෝ තලතෙල් මතුර කට සෝදනු—

42. බඩේරුජාවට

නමෝ ඉතාපිසෝසා. ඉඟුරු මතුර සත්ව දෙනු. වහා ගුණවේ.

43. සාව එකක්

නමෝ රාඹප්‍රාත්‍ර ලූනිබල දේශයෑ. බඩ අල්ලා මතුරණු. උනු වතුරෙන් එනු දියකාර මතුරා දෙනු.

44. සර්ප විසට

නමෝ සාන්තන්ගුරුළු මහාගුරුළු ඒ සවාහා. ඉඟුරු තැල්ලට මතුරාපිසා සතාටපිඹිනු. සාටවත් සොහොනියා කරණු.

45. සියළු සර්පවිෂ බැස්වීමට මන්ත්‍රයක්.

සද් නමසද්‍ර බුඩා සපීශාතා සපුන් විෂහංසනේ හෝ හෝ ජවලා— අසමුධුපජංලාම් සර්පවිෂය නාසති සෝසා

සබ්බාසි විසජා තීනං
දිබ්බ මනානං ගදන් විය
යන්නාසේසි විෂං ඝෝරං
සේසං වාපි පරිත්තකං

ආනකෙඛත්තමහි සබ්බසව
සබ්බදා සබ්බ පාණිනම්
සබ්බසෝපි විනාසෙයි
පරිත්තං තං භනාං මහෙ

ඕං ගරුඬ මූපාබහිරවාංග සිවධාරනෙ විසිර පාම්බු සෝසා සර්ප විෂනාසති සෝසා හුං හුං එට් එට් සර්පවිෂනාසති සෝසා

සියළු සර්ප විෂට මතුර දුම් ඇල්ලීමද බෙහෙත් මතුර දීමද යහපති. අත්දුටිම.

46 සියළු සර්ප විසට වෙදුමක්.

සීන් අරත්ත, සුදුළූනු, කොටා ඉස්ම ගෙන තශ්‍යකාර එම බිතාම සෑ මූකයට බවකුඹලෙන් වේදුම අල්ලා බඳිනු යත්තයි.

47 උගුරේ කටු හිරවුනාට.

නමෝ දියපිට දියකාව, කොමිලමිල ලිහිනියක් අත්තක් පිඹුදන් විෂකටුගසා කෑවා අදත් මේ කටු බසිනු, බසිනා නමෝ යකඩ කටු යකඩවාගේ කටු විෂකටු විෂපානාකටු බුදුන් වැලඳි කටු බුත් සරණෙන් බටු —බත්ගුලී ආහාස් මතුරා පිට අතින්දෙනු කතාකොහර එළිපත්තපිට හිට ගිලිනු -වතුර මතුරාදෙනු තෙල් මතුරාඋගුරේ ගානු අත්දුටු මන්ත්‍රයකි.

48 රත්වෑහාට.

ඕං ජය ජය අනන්තයෝ ස්වාහා දෙහිඅත්තෙන් මතුරනු

49 ඇස්වහ දෝෂයට.

ඕං ඕං රීං රිං ත්‍රිභුවන භවන පාද භ්‍ර මසතානි විඃල කමලාෂ කාරූස මණිමකුට ධාරණී ත්‍රිසූල සුඩසංජී විනයේතාජිනී භූතා දිපොනි විශ්වක්‍රෝධය යක්ෂරාක්ෂ කුම්භාණ්ඩ ඕං ඕං ඕං රීං රීං රීං හුං හුං හුං එට් එට් එට් මම වසපතතු කුරු කුරු වීර සිඩන්දු [illegible] යන් තෝස්වාහා:

කෙනපුරුද ඉරිදට එලිවෙන්ට ප්‍රථම කාථාතොකර නැවුන කලයකට වතුර ගෙණ අබ කපු ඇට වී දමා දෙහිකොල 7 ක් ඇති අත්තකින් 108 විටක් සුවඳදුං අල්ලා මතුර දෙනු ආංවරුවක් සෝදනු අප විසින් භාවිතාකල අත්දුටු මන්ත්‍රයකි; ඉතා යහපති.

50 වසනෑවාව

ඕන්නමෝභ නීලන්ඩන් විෂගාක්ෂනී ඒස්වහාඃ
වසනෑ උන්ඩ බුලත් මතුර කවනු,

51 කාඩුවෙ ගමට

දිවි කදුරු ඇට දෙඩන් කෙලලින් අඹරා ගානු ඊටම රත්කෙ වුල් කරදමුල් මුරුංගොමුල් දෙඩන් ඇතුලේ ලාපුළුස්සා කෙබුඅලේ උන අළුවෙන් උයා මිරිකා සුෂුයෙණ අඹරා ගානු අත්දුටුවකි

52 මුඛයේ පනුගඩුවට.

නමෝ සාරී ස්වාහා. ලුනු දිය මතුර කටසෝදවනු ගම්මිරිස් බැද මී පැණියෙන් පිට ගානු ඉදිමුන් බසී

53 පාඩන් සිකිවෙන්ඩ

ඕන් නමෝ දේවාක්ෂි මාක්ෂි මාක්ෂි අක්‍ෂර සිඩියාර දිවශර සිඩි සිඩි එසවාහා- ඉඟුරු පලල මතුර කළේ දමාගනු දුම්මලදුම තටටදිමද යාගකාරුවන්ට යහපති කිම්සිගීවෙයි

54 යක්‍ෂ අජීණි අම්යාදියට

ඕන් කුඩයේල් බෝධිරජ තම්රුනෝ යක්‍ෂ වීත ඉගිලි ඉගිලි වර වර ඒසවාහඃ ඕන් වඩයේල් කිලඹු කීලධාරී යක්‍ෂ අම්යා ඉගිල වර මර ඒසවාහඃ. ඕන් පොඩිඋලක්කුත් ආරුඪ නී වර වර පෙ අක්කුත් ආධාරණී ජය ජය හර හර ආරුඪ වර වරපෙ ඛක්කුත් ආධානී යක්‍ෂ අජීණි ඉගිල ඉගිල වර වර ඒසවාහඃ

අජීණි අම්යා ආදියට දෙහි ඇඹුල් ආදිය මතුරා දෙනු

55 පාඩන් හිටින්ඩ -(ගුප්තධාරණයට)

ඕං ඕං හ්‍රීං හ්‍රීං දිබ්බං අයිං නමඃ-ඕං ඕං කුරුනමඃ -ඕංරුම්හ්‍රිය ජග [illegible] නමඃ —ඕං ඉසුරුශතාත්‍ර වීංශතිනමඃ =ඕං ත්‍රිපුරලෝකා නිය [illegible] සද්ඕංත්‍රිපුණී භෛරවායනමඃ ඕං මහාරිට්ට රුමායනමඃ =දුනු [illegible] පිංසිදු මල් තටුවේ තබා 108 වරක් ජීවන් කරවලදනු බ්‍රමන වාරිවයම් කලක් පාඩම් කරත්ද ඒතාක් ගුප්තධාරණයවෙයි. අත් දූසතිබෙන සත්‍යවාදීගුරුනමක් නොසහවා සතිකරුණාවෙන්ම ලෝකයාට දුනිමු

56 දත් කැක්කුමට.

ඕන් වන් වන් ඒහි ඒසවාහඃ =කනාතොකර පොල් ඉරටා කැලිතුනක්, තබා ගෙණ 108 විටක් මතුර දත් හාරන්ඩ දෙනු— කතාතොකර පිටි අතින් දෙනු.

56. දත්පණුවාට

කුඹුරු ඇටමද දෙකි ඇටමද කරද ඇටමද මේවා සමව ගෙන දෙසි ඇඹුලෙන් අඹරා දත්පනුවාකැතැන තබනු. තිපවිටක්මෙසේ තබනු. දත්පනුවාගේ වේදනා නැසේ. පනු බිජ වැනසේ මිටම නිකමුල් කරදඹුල් තම්බා ගත්දියෙන් කට සෝද දත් අස්සේ රැඳී තිබෙන කුන ගුඩකලවිට වනාම් නුවවේ.

57 කන් විදිමට

නමෝ තාරුයනෝ බුත් මානී ඒසවරී ඕරු ඕරු ඒසවාහඃ — ඉදිකටුවට මතුර කනවිදිනු —ලේනොඑන්

63. අඩස්සියට

ඇහැල දළු මිටක් ගෙණ සිහිදූව අඹරා ගිතෙල් දමා බොන්නට දෙනු. මී තෙල් හා බඩ උණුවතුර පැණි තෙල් රෙද්දෙන් තවනු. එසේම කුප්පමේනිය, ජයපාලි කොල, එරබදු තෙලෙන් අඹරා එයින් අතා යටි බඩ පැලැස්තුලනු. මුත්‍රා නොයා නම් තීරබුල්ලිය, සොල් පලා කෂායකර හෝ ඉස්මන් නම් බාගෙ සිඳවා සීනි වැඩිකර දෙනු. හොඳ පේවතුරද සීනි සහිත තැඹිලි දියද යහපති. මීට මුත්‍රා නොයනවා නම් ලොකු කාන බාල්දියකට හොඳ උණුවතුර පුරවා එහිබඩ යටවෙන්ඩ ඉඳවනු- අත් දුන තිබේ. විතානි දුනගතින් මෙපිට මූත්‍රා පහවේ.- යකඩ කාරුණාවෙන් මේ විධි ප්‍රකාශ කරණ බැව් දතයුතුයි.

64. කෑල්මෙන් වන අඩස්සියට

අඹු ඉඟුරු, සුදුළූනු, කලන් 6 බැගින් ගෙන වතුර පත 8 එකට සිඳ එඬරු තෙල් දමා බොන්නට දෙනු.

65. කෑල්මෙන් වන හෘද වේදනාදියට.

පපුවේ හා හෘදයේ වේදනා ආදියට සුරිය ගහේ පො[illegible] කොටා කඩපිලිමේ තම්බා ගිනපි හාලේ කැඳ පිස ඒ කැඳට තම්බා ගත් සුරිය පොතු මිරිකා ඉස්ම වත්කොට බොන්ට දෙනු. කීප දිනක් මෙසේ කිරීමෙන් සුවවේ. ඊටම එරබදු මුල්, බෙලි මුල්, බටු මුල්, කටුවැල්බටු මුල්, පස්නාරන් මුල්, පොල්පලා මුල් නෙරෙන්චි මුල්, සමව ගෙන කසාය කර දීමෙන්ද පපුවේ සහ ලපැත්තේ වේදනා ආදිය සුවවේ.

66 පිටගැස්මට.

කැපුම් කොටුම් ආදිය නිසා පිටගැස්ම ආහොත් වැල්මී, වෙනි වැල්ගැට, කොත්තමල්ලි, කලන් 4 බැගින් ගෙණ පත 8 ට එකට සාකාරු ගිතෙල් සීනි ලා දෙනු.- එඬරු, මී, පුස්, කුඹුරු, මූකමල්, දෙබ යන මේ ඇට හා දෙබ, මී, කුඹුරු මේ පොතුද කොටා පොට්ටනි බැඳ වන්ඩුවෙන් තම්බා පස්තෙල් ගා තවනු. මේ තැවිම හනු පුවිටු වීමටද යහපති.

67. ගින්නෙන් දූවාට

මිදිකොළ, රතකිඳ කොළ, ඉස්ම මිරිකා ගානු. කෙසෙල් පතුරු ඉස්ම හා කොමාරිකා ඉස්ම ගානු- හුණුපොල් තෙල් දෙහි ඇඹුල් මිශ්‍රකර ගානු- රතකිඳ කොල හා කිලල කොල අඹරාගානු- යහපති.

68. යකඩෙන් දූවාම.

යකඩෙන් දූවාහම බී ගොම හෝ වතුගොම හුනු මී පැනි සමග ගානු- වන උණකොස් බුරුල්ලමද කොට්ට පොල් අඹුකත දෙසිඹුල් තෙල් සිඳ ගානු- යහපති.

69. උළුක්කුවට

තුන්පත් කුරුඳු, හීන්එඩරු දෙවගේ කොල පොතු සහ එනු ලා කොටා මලවා බඳිනු- ඊටම ලපටි පුවක් මුල් බැලතන තණඑනු ලා කොටා මලවා බඳිනු- ඇමැටිපීයවද යහපති.

70. උළුක්කුවට

දනත ඉසෙත් පාත සැදෙන උළුක්කුවට සහ එම ඉදිමුමට පුවක් ගසේ ලපටි මුල් ගෙන කහ ලුණු ලා කොටා තලතෙලෙන් මලවා බඳිනු ගුණවේ. තුන්දිනක් යනතුරු ඇල් දියෙන් නොතෙමනු.

71. සෙන්ගෙඩිවලට

[illegible] ., ගම්මිරිස්, තිප්පිලි, සහිඳළුනු, ඇඹුල්දෙඩන් ඉස්මෙන් [illegible]ම් බිස් ඇතුලේ ඇට ඇරදමා හක්කේ තබා සෙම අරිනු- [illegible] කබලෙන් බැද මී පැනියෙන් අඹරා පිට ගානු- සස්සඳ මුල්, වතපුද්ද මුල් අඹරා කටේ තබා සෙම අරිනු.

72. උගුරේ සෙම් ගෙඩිවලට

එනම් උගුරේ සෑදෙන සෙම් ගෙඩිවලට වැල්මී, අක්මැල්ල මුල්, සහිඳළුණු, තිප්පිලි, මඳටිය 10 බැගින් බරට ගෙන සොඳ ලෙස කලෙති ලා තලාගෙන නැවත රෙදි කඩකින් පොට්ටනියක් මෙන් දෙකක් බැඳ කටේ තබා සෙම ඇරීමෙන් උගුරේ සහ කල්ල යට ඉදිමුම බසී. ගෙඩි මතුවී තිබේ නම් ඊටම පුස්කර සිනක් කාරම් පස් ලුණු එක පමණ ගෙන සොඳසේ අඹරා පිරිසිදු පාන් කඩයක ඇඹුල් දෙඩම් ඉස්මෙන් දියකර ගා අව්වේ ලා වියලා එම පාන්කඩය ගෙඩිවලට තිපවිටක් ගෑමෙන් සෙම්ගෙඩි කුඩාවී ජුමවේ.

73 අජීර්ණයට

අසමෝදගන්, ඉඟුරු, අරළු, කරපිංච තැටි- කලං 3 බැගින් ගෙන වතුර පත 8 1 ට සිඳ සහිඳළුනු ලා බොනු- බුලත් මුල්, වෙලිවච ඉඟුරු, කොතඹ පොතු- කලන් 4 බැගින් වතුර පත 8 1 ට තකාරු බොනු- ඊටම කට්ටුවැල් බටු, අරළු, වෙලිවච ඉඟුරු, කරපිංච තැටි කලං 3 බැගින් ගෙණ වතුර පත 8 1 ට තකාරු සහිඳළුනු දමා බොනු. සැම අජීර්ණ හැරේ.

87 බල්ලා හෑවාට.

මූරුංගාකොල, රතුළූනු, හලතෙලෙන් අඹරා මලවා බදිනු. සනීපයි.

88. මුරලනට.

රසකිඳ කලං 6 යි, බෙලිමූල් කලං 4 යි, අමුකුරු කලං 2 යි මේවා පත 8-1 ට සිඳ බීමෙන්ද- රසකිඳ කලං 10 යි, අමුකුරු කලං 2 යි, මෙහ පත 8-1 සිඳ කසාය දීමෙන්ද සුවවේ.

ඊටම.

තිපල් ඉඟුරු කොතඹුරු ස්දී පැපිලිය ගතිමින් මනහ ද
තිමල් බැවිල වංමුනු ඉරිවේරිය ගතිමින් සමව ද
සියල් මෙහැම කහහල දිග ගහවැලදුමවදින දෙවරු ද
කොකල් ගහව සැම මූරළුන බැසයෙයි නීසැකව දනුසො ද

89. අශීස් රෝගයට.

වැල්පෙනේරකොල, රතුළූනු සමග සුහරතෙලින් කෝ ගිතෙලින් මලවා බත් සමග කනු ගුනවේ. දූත්ත, රත්නෙ...ල්, සිවිය අරළු කලං 3 බැගින් ගෙය කසායකර බීමෙන්ද ගෙඩි පැල...

මීටම චූණි බෙහෙත.

විශලා කුඩුකරගත් සිවිශ, දූත්ත, රත්නෙටුල්, අරළු කලං 3 බැගින් ගෙන විශලා කුඩුකර ගත් කිඩාරම්අල කලං 6 සමග කලවම්කොට නැවත එන්සාල්, කුරුඳුපොතු, කොල්ලම්කොල, ඉඟුරු, ගම්මිරිස්, තිපපිලි, සාදික්ක, කරාබුනැටි, වසාවාසි, නෙළුම් රේනු මංචාඩි 4 බැගින් ගෙන කුඩුකර ඊටම එක්කොට නැවතත් සියුම් රෙදිකඩකින් ගලාගෙන සහිදලූනු පෙරුම්කායම්කුඩු මදට 10 බැගින් ගෙන අනාගත් බෙහෙත් බරට උක්සිනි මිශ්‍රකර සොඳින් අනාකබාගෙන වේලකට කලඳ බැගින් වැලදීමට ගිතෙලින් අනාගෙන යුතුයි. අශීස් සුවවීමට යහපති.

90. මුත්‍ර සමග ලේ යනවාට.

ගල්මඳ, එන්සාල්, සුදුසඳුන්, වැල්මි, ඉගිනිඇට, මේවා කලං 2 යි මදට 10 බැගින් ගෙන වතෙහිලා කුඩුකර නැවත නැඹිලි ගෙඩියක ඇස්ස සිදුරුකොට වතුර පතක් අඩුකර බෙහෙත්කුඩු එම ගෙඩියෙන් ගෙඩියේලා සෙවනක තබා 30 පැයක් පසුකොට පෙරා දවසේ දෙවේලට වලඳනු.

ඊටම

රතුළූනු, එළුබලිඳ, කොල, පොල්පලා සමව ගෙන වතෙහිලා කොටා නැවත කඩපිම්මෙන් තම්බා මිරිකා උක්සකුරු සමග බොන්ට දෙනු. මුත්‍ර සමග ලේයාම ගුනවේ.

91. මුත්‍රා සමඟ ධාතු යෑමට

අඹුහොල්ලී මිපිකොළහත් යුෂ පතක් පමණගෙන මීපැණි පැණි රස දෙනහාකුරු දමාගෙන වළඳිනු. නිසැකව සුවවේ. මුත්‍රාදැවිල්ලද පුච්චාම සහ සුදයාමද මෙයින් සුවවී ගෙඹමියධාතුද එසයි. තදින් දෙස් ඇති අයට අඹුහොඩු පතක් පමණ තැනගොත් වේලනව පතබාගය බැගින් වැලදීමෙන් ගුනවේ

92, උදුවහීයට

සියඹලා, ඇඹුල්, සහිදලුණු, සීනි, හම්බා තෙපාඩිකර හත්කාලද සුදුළූණු සමග සොඳින් එකට අහා මැඩගත් දිය පතක් පමණ වළඳිනු. ගුනවේ. ඊටම අරළු, සියඹලාකොල, සුදුළූණු, ඉඟුරු, පෙරුම්කායම්, දෙකලත් මදට 8 බැගින් ගෙන කසායකර සහිඳ ලුනුදමා බොන්ට දෙනු ගුනවේ.

93, ශරීරයේ හැදෙන ලේ ගඩගෙඩි ආදියට

කෝමාරිකාමද, වැල්බුරුල්ලා, ගාල්පිටි, අඹුකහ සමග පොල් කිරෙන් [illegible]ම්බා ගෙඩි මතුපිට ගෑමෙන්ද පුරුක් මැලේ දළුව සමග [illegible]සිල්පාතුදියෙන් අඹරා ගෙඩි මතුපිට තැබීමෙන්ද ගෙඩි ස[illegible]රව පිටවී සුවවේ.

94, වන තුවාලවල ඉසඳ පනුවන් නැසීමට

දුම්මලතෙල්, කජුතෙල්, කොසඹතෙල්, එකපමණ ගෙන සොඳ දුම්කොළ තැබෙල්ලක් රත්කොට කුඩුකර එමතෙල්වලට බහා කලවම් කොට මදයින්තෙත් හෝ අව්වේ තකාරා පෙරාගෙන පනුවෝ ඇති තුවාලයට ලනු. මෙසේ කීපවිටක් ලෑමෙන් පනු කැදුල්ල සමග බීජ නැසේ. තුවාලය සුද්දවී ගුනවේ.

95, දියවැඩියාවට

නීරමුල්ලිය තලං 12 ක් ගෙන කසාය කර මීපැණි සමග දෙවේලේ වළඳිනු. කීපදිනක් මෙසේ කල යුතුයි. දියවැඩියාව සුවවේ.

96, කක්කල් කෑස්සට

පාන්වෙන වේලාවට කතා නොකොට ගොස් වල්බෙලිගසේ මල්තුනක් බැගින් තුන්වේලකට හමයක්ගෙන පැසෙන උණුවතුර පතබාගයකට මල්තුනක් දමා හම්බා පුකිරි සමග තුන්වේලක් බොන්වදෙනු. සුවවේ. අත්දුටුතොම්යි. (මාඇත් බැවිල)

97. ඇදුමට.

පීදු දලියත් කීපදෙනෙක් සොයාගෙන පැසෙන උණුවතුර වත්කොට (කෝපිසාදන ලෙස වසාතබා) නැවත එම්වතුර පුකිරි,

තිප්පිලීකුඩු සමග පැණිබාගයක් පමණ වලඳනු. නිවාවට ගුණවේ. අත්දුටිමි. රෝගියාට සහවා සාදනු.

98. සෑම සන්නි රෝගයටම

ඉඟුරු, ගම්මිරිස්, තිප්පලි, අරළු, බුළු, නෙල්ලි, කොත්තමල්ලි, වදකහ, කටුකරෝසන, කොහොඹපොතු, රසකිඳ, කලාදුරුඅල මේවා කලං එකබැගින් ගෙන වතුර 8–1 ට සිඳ සීනි සමග දෙවේලට වලඳනු. සුවවේ.

99. උෂ්ණ ලෙඩට

සැවැන්න, නෙලුන්දඹු, මාතෙල්අල, ඉරිවේරිය, රසකිඳ, සුළුකුරුම්බුල්, කලාදුරු මේවා කලං එකයි මදට පහලොව බැගින් ගෙන කසාය කර තනකිරි මුසුව දෙවේලට වලඳිනු. ගිනියම්ලෙඩ ගුණවේ.

100. අන්ඩ වායුවට

ආඩාතෝඩාමුල්, සුදුළූනු, මැලලමුල්, අරළු, එකපමණ ගෙන කලංතුන බැගින් කසායකර වැලඳීමෙන් අන්ඩවායු ගු[illegible]

101. ක්ෂයරෝගයට

(මාඇත්බැවිල) වල්බෙලිගහේ පිටලෙල්ලහැර රැගත් පට්ටා කලා මිරිනාගත් යුෂ කිකිළිබිජුවෙ සුදුමදය සමග කලතා පැණි දොඩම් ඇඹුල් පුකිරිකුඩු සමග වැලඳීමෙන් ක්ෂයරෝගය සුවවේ.

102. ඇස්රෝගවලට

ඇසේ සෑදෙන රත්මස් වැඩීම් සමග දුඹුරු රත් ඉරි සුවවීමට තිප්පිලි කලඳසි, තුත්තත් කලඳසි, පිටපොතු හැරගත් අරළු සතර කලඳසි, මේ බෙහෙත් හොඳින් කුඩුකර පැසිච්ච දෙහි ඇඹුලෙන් අඹරා ගුලිකොට සෙවන වියලා තබාගන ඇසේ ගානවිට පමණට තනකිරෙන් උරච්චිකර ගානු. හෙදකොල, ඉගිනිඇට, මුකුණු වැන්න, වැල්මී, අරළු, සුදුහඳුන්, රත්හඳුන්, සියඹලාදළු, කුරම්බුල් ගොඩමාතෙල් මේකිදෙය සමවගෙන හාල්පානුදියෙන් තම්බා අඹරා ඇනවෙට්ට ගානු. උෂ්ණයෙන් ඇස් ඉදිමුම්ද රුජා සමග කදුළු සහ රත ආදී ඇසේ රෝග ගුණවේ.

103. ළදරුවන්ගේ වලිප්පු රෝගයට

වෙල්කිම්වල කිරිපනුවන් කීපදෙනෙක්ගෙන සාදික්කා සමග අඹරා දෙසිඇඹුලෙන් අනා පුනුදියර සමග පොවනු. ළදරු වලිප්පු රෝගය ගුණවේ. මෙය විශේෂයෙන් ප්‍රත්‍යක්ෂයි.

104, විෂකටු සහ සතාධ ඇණ ඇනුනාව

නාමරංකා ගෙඩිගෙන තගළතුලා උණු අළුයට තබා තම්බා ගෙනද බිලින් ගෙඩි ගෙන එසේම සාදා ගෙනද තුවාල මුඛයේ තබා බඳිනු. විස සම්ග කටු ඇදී සුවවේ.

105. බාලයින්ගේ ග්‍රහණි රෝගයට දෙලදීමෙ ශාස්ත්‍රාගමයක්.

උපන් ප්‍රථම වර්ෂයේ සෑදෙන ග්‍රහණි රෝගයට.

ඕං ශ්‍රී ධාරණ ඉගිල ඉගිල පෝඩුම් ජපාඃ – ඕං මෛවරණ්ඩ කාලි සැඩපලු තම්බිරාමෙන් ඉගිල ඉගිල සාම්සඃ.

උපන් අවුරුද්දෙදන් පැමිණෙන ග්‍රහණිරෝගයට නොඉදුල් බතක්උයා කුල්ලේ පිරුමවයක් එලා දෙලොස් ගොඩක් පුද පාන්වැටි දෙලහක් ගිතිඅවිලා තබා තැඹිලිගෙඩියක් ඇස්සකපා කුල්ලේ මැදතියා විලක් කුවක් තැඹිලිගෙඩිය මැදසිටුවා මේදගැන දෙලො[illegible] සැවවිටක් මතුර කුල්ලේ පුදභොජනවලට දුම් අල්ලා [illegible] පස්පටක්ගෙන ගැට පහක්ගසා ඇදුරු පොල්ගෙඩියක් [illegible]තබා මෝලංකඩ (රදළතොට) දපා කුල්ල පපුවපිට තබා තුලට යටකි දුහැන දෙනතන් 108 වීට මතුර ග්‍රහණි ලමයාගේ කරේ බඳිනු. උපද්‍රාකල යකුත් දුරුවෙත්.

උපන් දෙවෙනි වර්ෂයේ සෑදෙන ග්‍රහණි රෝගයට

ඕං ඕං හ්‍රීං හ්‍රීං හුං හුං ද්‍රූම් ද්‍රූම් යඃ — ඕං හිං රුම් රුම් ද්‍රීං ද්‍රං ප්‍රාං ප්‍රාං තාං තාං හාජු හාජු හ්‍රීං හ්‍රීං ප්‍රමේශ රම්‍යාගෙන් නලඃ

උපන් දෙවුරුද්දෙදන්. පැමිණි. ග්‍රහණියට: නොයිදුල්වා කිරිබත් උයා පොල්මලක් කපා ඉපියාව ගෙන බත් දෙලොස් ගොඩනට බෙද පාන්වැටි දෙලහක් තියා කඩුල්ල මුව දපා මෝල්ගහ පයට තබා නුල් හත්පොටක්ගෙන අඝෝරශිය පුරවා කරේ බඳිනු. ග්‍රහණිය දුරුවෙයි.

106. සර්වමන්ත්‍ර ජීවය

ඕං ෂෙනබලී නොසියේරින්කුම යදිරප්පාගේ ප්‍රලජීමන්තු අපුඩි සෙල්ලුම වා වා.

ඕං පිසාච සෙල්ලුම ඕලීංඩි උසිඹුසික්කාමාරේ මරඹුදිලෙප්පු උසිලාංකු ප්‍රාණදිපෙරිකතුම ජීව ඕෂධ ප්‍රාණ ප්‍රාණ කුරු කුරු භවන්තු සිඹන්තු ජීව ජීව ජීවාහා. මෙය සර්වමන්ත්‍ර ජීවයයි.

107. සෙමෙහි සෑදෙන සිදුරු ලෙඩට අනගි බෙහෙත් තෙලක්.

1 තිහත් මිච්ච නිශුරඹ සරිවීල යා
වරක් තලා විසුද්ද මෙනොල යා
අලත් ඉඟුරු අඹු ලුණුද තෙල යා
ගසෙත් මුරුංගා ගනිමින් මුල යා

2 පුසගෙන මෙහැම කොටමින් වෙන වෙ න
පිස තලතෙල් සහ පදමට බාගෙ න
හිසකට කණලුව බිහිරිත් නසමි න
ගොස සහවණ හැකිකරවයි තියනි න

3 සවිඳ සතාවාපිය මුල් දෙව් දූ රූ
එවදකසා කොට්ටම් සිද්දිඟු රූ
සුඟුද මෙහැම් පලමක් ගෙන ඇඹ රූ
ඔසුද තල්කයට ගනිමින් සොඳු රූ

4 එලගෝමුද නැලියක් ලා බද [illegible]
කල තල්කද එහි දිය කරවමි තේ
තලතෙල් නාලක් ලා සිඳ සොඳි තේ
කල දුන සම පදමට බා රැගෙ තේ

5 ගින්නට පා රත්කරමින් මෙතෙල ද
කන්තුලවත් කල හොත්ගෙන එමය ද
කිනිතුළු කන්වැයෝ කුරුමිනියෝ ද
ගොන්මැසි මෙකියන සත්කණ වැදුම් ද

6 පොල අවගණදත විදිනා දුකට ත්
කණ යට සිට සාරය එන අයට ත්
නැමච්ච නැක්කුම් රුජා සමනට ත්
අඳුරට රිම්වෙනි තොල මෙම ලෙඩට ත්

108. හිසේ රෝගයන්ට අනගි බෙහෙත් තෙලක්

1

මුකුණුවැන්න කොහොපිය හිකිරිඳිය වැටකේමුල් පුසනැලි බැගී ණා
එලකිරි නැලි දෙහාකුත් සම්භාරගණ පලමු පුසට තලනා රැගෙණා
තලද එඩරුතෙල් ගිතෙළුත් සමගිව මිනා බැගින් එහි වක්කර ණා
මිදක් කාකාරු තල්කය එහිලා හොළුම් මලක්සේ ගිනිකර ණා

2

දේවදර වැල්මි ඉරිවෙරිය මුකුනුවැන්නමුල් සැවැන්දරත්
බැවිල පතුරු සහ සුප්පමේනියද හිඟුරුමයිලි කිම්තඹුරු මුළුත්
ඉඟිනැට උරුලේද හාමල්ජේෂ්ඨද කයිප්පු සහ එල මලිද මුළුත්
දේදුරුද වගපුල් සුදුහඳුනුත් සහ තිපල් මෙසැම කුන් කුන්තලේදත්

3

කල්කයොද කුන් දිනක් සකාරු මුදපාක එක පදම බලා
කල්ක ඉටිමෙස එක තම පදමක්දුට මඳු පුමඳය දක තෙල බාලා
තෙල් බා තබමින් යුතුබාජනයක සිද්දියෝගයෙන් ඉස බැඳලා
කල්දක ඉස තෙල්ගෑර ශෝදිමෙන් දේශයෙහි ලෙඩගුණකරලා

4

ඇසට ඉසට එන ලෙඩද කපාලද තිමිරත් කාංචත් පටල නසසි
කළුපටලද උල්මාරම පටලද පුප්පවලත් ඇස් අඳුරු නසසි
ඉස කැක්කුම ඇස රතද සමගින් උෂ්ණ ඇදිරිද කිහිරි නසසි
ඇසේ කාමිද කන්වල කැසුමුත් සිරෝ රෝග මුල්සිඳ වනසසි

5

මින් ඇදිංකන්වන කණීසූලයද තාසෙන්එන සොටුගද වනසසි
ඉසකෙස් වසිමින් කර කළු වෙමිනුත් වැවෙනා ඉසකෙස් සවිකර දේ
සෑ..ක් මෙතෙල් ඉසබැන්දෙත් මොහරපිල සෙ ඉසකෙස්බබලසි
ස.. කරවිල වම්බෙබාටු හොස්නැර එලකිරිමෝරිත් බොජුන්සොද

6

පිළිහුඩු අත්හැර ඉසසේදුවොත් ඇඟ රත්වත් පාටින් බබලසි
ඉඳුනිල රුවවිලසට නෙත්දෙක ඔපකරවාලා පහදු දේසි
චක්ෂුසුවදවට විහිදුන විලසට ආතුර ආරක්ෂා කරදේසි
චක්ෂුකාන්තිය යනමේ තෙතෙලින් ඉසේ ඇසේ ලෙඩ දුරුකරදේසි

7

කටගඩ වඩමින් පාඩම්වීමද ගොළු කිහිරිත් හැර බුද්දි මඩසි
හැපවඩවා ඇඟ රත්පිත් දයද පිපාස වැඩි ඔල්මාද නසසි
කටවෙලි නැසිමුණු සමගින් එන සයරෝගද වනසා සෙතදෙසි
හැටහතරක් ලෙඩදුරු කරහැපදෙන චක්ෂුකාන්තිය නම තැබුමසි

100. සියලු වාතරෝගයන්ට අනගි බෙහෙත් තෙලක්.

සතාවාරියමුල් හැටසතර පලමක් ගෙන දියහැලි දහසයකලා සතර හැලියට සිඳුවා සකාරා තිඹිහැලි පෙරාඑපමණ එලකිරි ගෙන හැටසතර බැබිල මුල්, සුළුපස් මුල්, මහපස්මුල් මෙකී සැම සතර පලමක් ගෙන දිය දහසය හැලියක බහා සතර හැලියට සකාරාගත් කසායත් ඊට එක්කර කල්කයට ගත්තාලද බෙහෙත් සතකුප්ප, වද, සිද්දි, ගුරු, සහින්දලුණු, රාසනා, එනසාල්, දෙව්දුරු, කදුන්, කොට්ටම්, ගල්මඳ, සුදුරුත්ත, අස්ගොඩු, මිරිස්, ජටාමාංස, වැල්මඬදට, මෙකී පලම පලම ගෙන අඹරා

කල්කෙල් සතර නැලියක් සමග යහපත් කොට මදගින්නෙන් කසාරං බා පෙරා රන් රිදී තඹ මැටි යනාදී එක්තරා භාජනයක සුරැකිව කබා නස්‍ය පාන අනුවාසන අභ්‍යංග යනාදීයෙහි යෙදිය යුතු, බලයද මේධාවද අග්නියද වඩනේයි, සර්වාංගවාත එකාංගවාත කොෂ්ඨවාත සන්ධිගතවාත ශිරෝගතවාත යනාදීයෙහි ගැල්වීමෙන් කාස අර්දිත, හනුස්තම්භ, කර්ණරූජා යනාදීයෙහිද දරුණු උරශ්ශූල බඩරූජා ස්ත්‍රීන්ගේ යෝනිශූල යනාදිය විශෙෂයෙන් නසන්නේය. අභිඝාතයෙහිද අස්ථිභග්න සන්ධිච්‍යුත යනාදියෙහි පසස්තාලද්දේයයි මුනීශ්වර භාෂිතයයි දන්නාලද් නෂ්ටාර්තී කාකවන්ද්‍යා විද ස්ත්‍රියක්හෝ මේ තෙල සේවනය කළේවී නම් නැවත පුත්‍රොත්පත්තිය වහාම ලබමින් ආයුෂයද යසස්ද වන්නේය. ගර්භිනියක් සේවනය කළේ නම් ගර්භය වර්ධනය කිරීමට උතුම් වන්නේය. බලපුෂ්ටිකිරීමද වේ. ශීඝ්‍රයෙන් ප්‍රජාව උපදවයි. යම් ගෙයක මේතෙල තිබුනේ වී නම් ඕහට වාතයෙන් වන භයක්ද එසේම භූතයන්ගෙන්ද රාක්ෂයන්ගෙන්ද පිසාචයන්ගෙන් වනභය නොවන්නේයි මේ සිද්ධාර්ථ නම් තෛලය ජීවක [illegible] විසින් කියනලදී.

මෙම තෙල පදන්කරණවිට තුන්වේලක් තුන්සුත්‍රම [illegible] නේ පුරවාගැනුම වඩායෙහෙකි.

110 බෙහෙත් තෙල් සෑදීමේදී දැනගතයුතු වැදගත් කරුණු.

යම් තෙලක් බෙහෙත් පමණක් කියා ගණන් [illegible] ආදිය නොකියා තිබේ නම් තෙල් නැලියකට සිදිතොත්, බෙ[illegible]ත් සතර නැලියක් පලම් හැටහතරක් හෙන පැන් සොළොස් නැලියක් හෙව සතර නැලියට කසාරු පෙරු තෙල් නැ[illegible]ක් කිරිනැලියක් කල්කපතක් හෙවත් පලම් හතරක්ලා මදගින්නෙ[illegible] [illegible] සිඳ්දයුතුයි. තෙල් නැලිදෙකට සිදිතොත් මෙකී සියල්ල දෙගුණයක්ද මනාවකට සිදීතොත් මෙකී සියල්ල භාගයක්ද මේක්‍රමයෙන් දතයුතුයි. ඒ තෙල් පාකතුනකි. කල්ක ඉදුන්සේ අත ඇලේ නම් මෘදුපාකයි. එය නස්‍යයටද, කල්ක ඉටිසේ ඇඹරෙණ කල සම පාකයි, එය නැම් පීම වස්ති ආදියටද, කල්ක කැකුලුව වැටිවනුයේ ඛරපාකයි, එය ඇඟ ගැල්වීමටද දතයුතුයි, සම්පාකයට තෙල් සිඳගත්තාම නස්‍යපාන අභ්‍යංගාදී සියල්ලටම හොඳයයි සිතාම්.

හරයහිතවූ ද්‍රව්‍යයන්ගේ කෂාය දසදවසක්ද සියලු මුල්ජාති කෂාය සත් දවසක්ද, වැල්ජාතිය තුන්දවසක්ද, ධාන්‍යජාතිද කොළජාතිද එක දවසක්ද කසාරු ගතයුතුයි.

උදුරා කොට තයින් මැඩගත්තේ ස්වරසයි, කෂාරණ ලද්දේ කෂායයි, රැයක් දමාලත් දියෙහි තබා මැඩි කෂාය ශීත කෂායයි, එකෙනෙහි තලාපැත්ලා මැඩ පෙරාගත්තේ පාණ්ඩයයි

ද්‍රව්‍ය යෝගයෙන් අඹරන ලද්දේ පොම්පලද චූර්ණයකල්කයි, බෙහෙත් ඇඹරීමෙහිද හැලතීමෙහිද තෙල් හැකැරීමෙහිද ද්‍රව ද්‍රව්‍යයන් හැතිකල්හි ජලය යෙදිය යුතුයි.

සියළු බෙහෙත් සංයෝගයට අනගි මන්ත්‍ර දැහැනක්.

තෙරො ඖෂධාන්‍යම් අමෘතම් භවන්තු කුරු කුරු සිඩ හනු ජීව ජීව ප්‍රාණ ප්‍රාණ ඒසීවාහා මෙම මන්ත්‍ර දැහැණින් සත් විටක් සියලු ඖෂධ සංයෝගයන්හි භාවිතා කටයුතුයි.

ඖෂධ වර්ග හැඳින්වීම

[illegible] විසින් මුද්‍රණය කරන්ට පමුණුවා තිබෙන මෙම මන්ත්‍ර ඉසෙ[illegible]සාර ග්‍රන්ථයේ ප්‍රථම භාගයේ විස්තර කොට පෙන්වා
12 ස[illegible] බෙහෙත් ද්‍රව්‍ය නම් කිරිකෙවෙළ මූහුදුබඹ සාරකිම්වල
13 [illegible] පැලෑටි වර්ගයකි. එය ඇතුගස් වැනි කොලකීපයකින්යුත් කිරිපාට මල් සවල්පයකින්ද යුක්තවේ. මෙය වස්කඩු පලාතේ [illegible] කිරිපතුවාද කිරිකෙවෙළ වෙනුවට ගතයුතු බවද කැයේ.

වෙල්කිම් නොහොත් මඩකිම්වල සිටින කිරිපාට පණුවන් වර්ගය අ[illegible] ඖෂධයකි. එම ඖෂධයෙහි ඇති සත්‍යතාවය මෙම පොතේ [illegible]ගීත ඖෂධ යොගයෙන්ම විතිගවය වේ. එනම්:—
(ළදරුවන්ගේ ඩිලිසපු රෝගයට)

ඇත්[illegible]විල නම්—අතෝද නමින් ප්‍රකට බෙහෙත් පැලෑටි වර්ගයකි. ඒ සඳහා වැඩි [illegible]නර තොලියම්.

මාඇත්බැවිල නම්:- දූනට අපවිසින් සැම පලාත්වලම දන්නා අඳුනන වල්බෙලි නම් වර්ගයකි. මෙහි ඇති සත්‍යතාවය තේරුම් කිරීමට මෙම පොතේ ඇඳුනත් ඔබිත්යෝග දෙකක් ඇත. එනම් කස්කල් කැස්සට සහ ක්‍ෂය රෝගය සඳහා මෙහි

බිම්කොහොඹ නම්:- දූනට බෙහෙත් කඩවල වෙළඳාමට ඉතාව පැලෑටි ශ්‍රීම්‍යයද, ඉන්දියාවේ කාල්කටා ආදී පලාත්වලින් ගෙන්වන කිරාත තික්ත නම් ද්‍රව්‍යයද නොව අප පලාත්වල කාර ඛිම්වල වැවෙන නොයාගතහැකි පැලෑටිවර්ගයකි. එම බිංකොහොඹ වර්ගයට අප සමහර පලාත්වල අය ගැටකොහොඹ, හීන්කොහොඹ වල්බිත්කොහොඹයයිද කියත්. වන්නී පලාත්වලින් ගෙන්වන

හින්කොහොඹවලට වඩා (උතපලාත් වලින්) අප පලාත්වල සොයාගැනීමට තිබෙන මේ බෙහෙත් ද්‍රව්‍යය වැඩිවශයෙන් උණ රෝගයට ගන්නා ඖෂධයක් බැවින් මේ ඖෂධය පුරුද්ද පුහුණු කිරීම වඩාත් යෙහෙකිබැව් වැඩිවශයෙන් සලකා මතක් කරන්නෙමු.

රත්කිරිගොකටු නම්:— පැලෑටිවර්ගය වැල්ලබඩ සාරවත් බිම් තිරවලදී දකින්ට ලැබෙයි. සැම්කාලඑලම පයාගල දකුණේ ස්වෙසන්පොල අසල මේද්‍රව්‍යසොයාගැනීමට ඇත. මෙම ද්‍රව්‍යයේ විසතර නම් අලු පැහැවර්නින් ගහ සැමතන්හිද මල රත්වන් පාටින්ද කොල! ගහව සහ කටුසහිතවද කොල හෝ කරටි කඩා බැලිමෙන් රත්පැහැවන් කිරි මතුවෙනවා ඇත.

රැනමලි නමින් අඳුන්වන ඖෂධය:— බොහෝ තැන්වල මල්ගස් වශයෙන් ගෙවතු මිදුල්වල වවා තිබෙන රැම්හමාලි නමින් ප්‍රකට වර්ගයකි. තුවාලවල වෙදකම් සම්බන්ධ වට්ටෝරුවල නියම කර තිබෙන (රැනිය) නම් ඖෂධය මෙයයි. මේහි ඇ[illegible] සත්‍යතාවය වටහාලීමට මෙම පොතේ ඖෂධයෝගයක් තුව[illegible] නියම්ව ඇත.

/ නේ

දිමකිජු නම්:—ඖෂධ වර්ගය ඇතැම් අය දිමියන්ගේ කූඩුවල තිබෙන දිමිකිත්තාර අරගනිති. එය ඉඳුරාම වරදකි. දිමකිජු නම් පැලෑටි වර්ගයකි. එය හඳුනාගැනීමට පහසු විදිහනම් ගම්මිරිස් ඇට වාගේ ගෙඩි ඇත. ඉඳුනුගෙඩි රත්පැහැ වණීයි. එම්ගෙඩි පොඩිකලවිට දිමියං පොඩිකලාක්වැනි ගඳ ඇතිවේ.

බිම්මුල් නම්:— පොළොවේ සැදෙන ඖෂධ ද්‍රව්‍යයකි. මෙය සමහර පලාත්වල කාබුක්ගල් අතරෙහිද, මැටි සහිය බිමවලද පායන හාතූවේ බිම්හොටන්නන්වද සොයා ගතහැකි සුදු වණ් යෙන් සුදු සිහින් තුල් කැබලිමෙන් වවව ඇතිලිමෙන්ද ඇත. මේ ද්‍රව්‍ය අඳුනන අය නොයෙක් පලාත්වල පාගේ සිටිනවා ඇත. සමහර අය විසින් පතුමාද බිම්මුල් වශයෙන් ගන්නා බව අසන්ට ලැබීම දෙශයට කරුනක් බව මෙසින් කෙලිනරම්. බිම්මුල්වල ඇති ඖෂධ බලය පිරිසිදු කස්තුරි වලට දෙවෙනි නොවන තරම්බව හැගවීමට නවතාන්ටබැරි නාදලේ වණනයට බිම්මුල් මදව තුනක් සොත තනකිරෙන් අඹරා සූකිරිකුඩු දෙසිඹුල් මිශ්‍රව වැලඳවීමෙන් සොඳින් අවබෝධ කරගතහැක.

මතු සම්බන්ධයි.

පටුන.

1 රජ වෛශ්‍යාව
2 රජ වෛශ්‍යාවට දිෂ්ටියක්
3 ත්‍රිලෝක වෛශ්‍යාව
4 සර්ව ලෝක වශිය
5 දූෂට ස්ත්‍රීන් වශිය
6 ස්ත්‍රී වශියක්
7 නාරසිංහ මන්ත්‍රය
8 ශ්‍රී මෝහන ධූපය
9 සර්ප, මූෂික, මකුණු ආදි සතුන් පැන්නීමට
10 ගෙවල්වල සිටින සතුන් පැන්නීමට
11 නයා පැන්නීමට
12 සස්‍යා රක්ෂාවට
13 සස්‍ය වැඩීමට
14 පියපුරු දූඩි කිරීම
15 බාලයන් සහ ගර්භිනීන් ආරක්ෂාවට
16 බාලයන් සහ ගර්භිනීන් ආරක්ෂාවට
17 සොරභිය නැතිවීමට
18 යක්ෂ භූතාදි භයට
19 කැපුනාව
20 වාද ජය ගැනීමට
21 පිට ගිය අශ ගෙන්නීමට
22 දීඝායු වළඳන්ට
23 සම්පත් ලැබීමට
24 ග්‍රහපීඩා දුරු කිරීමට
25 හවසින්ගේ කිරි වැඩි වෙන්ට
26 ගුළි ධාරණයට
27 කවහඩ වැඩීමට
28 ජ්වම
29 සෙලවෙන දත් සවිකරන්ට
30 විෂ කැවාව
31 සිගලු සර්පවිසට
32 සිංගලු සර්පවිසට
33 තව එකක්
34 උභ බන්ධන්ධ මංත්‍රයක්
35 කැපුනාව ,,
36 උලුක්කුවට ,,
37 ලේ හිඳුන් යනවාට
38 ගින්නෙන් දූවාට
39 රක්ෂා මංත්‍රයක් ළදරුවන්ට
40 දත් කැක්කුමට මන්ත්‍රයක්
41 දතේ රෝගයට
42 බඩ රුජාවට
43 ජ්වම
44 සර්ප විෂට
45 ජ්වම
46 සර්පවිෂට වේදුමක්
47 උගුරේ කටු හිරඋනාම
48 රත් වෑයාව
49 ඇස් වහට සත්‍ය ගුරුකම
50 වස විෂ කැවාට
51 කඩුවේගමට
52 පනු ගඩුවට
53 පාඩන් සිහිවෙන්ඩ
54 යක්ෂ අජීර්ණ අම්යාදියට
55 පාඩන් හිටින්ඩ
56 දත් පනුවාට
57 කත් විදීමට
59 මූරුත්තාවට
60 රන්දෙණ ගාථා සහ ගුරුකම්
61 බඩ රුජාවට
62 ගුල්ම රුජාවට
63 අබස්සියට
64 කැල්මෙන් වන අබස්සිය
65 කැල්මෙන් වන කෑද වේදනාදියට

66 පිට ගැස්මට හා හනු පූට්ටුමට
67 ගින්නෙන් දූවාට
68 යකඩෙන් දූවාට
69 උළුක්කුවට
70 උළුක්කුවට
71 සෙම් ගෙඩිවලට
72 උගුරේ සෙම් ගෙඩිවලට
73 අජීර්ණයට
74 කන් කැක්කුමට
75 ඉස රදයට
76 ඉරුවා රදයට
77 හික්කාවට
78 සෙම් ප්‍රතිශ්‍යාවට
79 නාසය තුවාල උනාට
80 උගුරේ යමක් හිරඋනාට
81 ඇස් රුදවට
82 ඉන්නන් වඳවීමට
83 කුඩා ළමයින්ට යමක් ගිළුනාට
84 නාසය ඇහුරුණාට
85 පතු කැවිල්ලට
86 වතුරේ ගිලිසින්ට
87 බල්ලං කෑවාට
88 මූර උනට
89 අශීස් රෝගයට
90 මූත්‍ර සමග ලේ යනවාට
91 මූත්‍රා සමග ධාතු යෑමට
92 උදු වතීයට
93 ශරීරයේ සෑමදෙක ලේ ගඩගෙඩිවලට
94 වන තුවාලවල ඉහඳ පනුවන් නැසීමට
95 දිය වැඩියාවට
96 කක්කුල් කැස්සට
97 ඇදුමට
98 සෑම සන්නි රෝගයටම
99 උෂ්ණ ලෙඩට
100 අන්ධ වායුවට
101 ක්ෂය රෝගයට
102 ඇස් රොගවලට
103 ළදුරුවන්ගේ ලිපපු රෝගයට
104 විසකටු සහ යකඩඇන ඇනුනාට
105 බාලයින්ගේ ග්‍රහණී රෝගයට දෙලදීම
106 සජී මන්ත්‍රජීවය
107 හණීරෝග තෛලය
108 චක්‍ෂුසාහති තෛලය
109 සිඩාජී තෛලය
110 බෙහෙත් තෙල් සාදනම්බ
111 ඖෂධ වගීකැදීත්වීම

විශෙෂ දැන්වීමයි.

මේ ග්‍රන්ථයෙහි සඳහන් පරිදි හදිසි ව්‍යාධීන් ව්‍යුපශමන සුව උපකාරවත ඖෂධ යොගයන් වෙනත් නොයෙක් රෝගවලට යෙදිය යුතු පිළිවෙළ හා,

ගාථා මන්ත්‍ර ගුරුකම් ආදිය එසේම අන්‍ය කටයුතුවලට යොදන ක්‍රමයන්ද,

තෝරාගැන්මට දුෂ්කර ඖෂධයන් පිළිබඳ මනා හැඳින්වීමක්ද, බෙහෙත් තෙල් සැදීම හා වටිකා ගුලි කල්ක ආදිය සෑදීමේ පිළිවෙළ සහ ගෙඩි, වණ, දද, කුෂ්ට, කැඩුම් බිඳුම්, ආදි ව්‍යාධීන් පිළිබඳ චිකිත්සා ක්‍රමයද

මතු භාගවලින් ප්‍රකාශවන බැවින් මෙය ආදරයෙන් කියවීම හා මතු භාගයන් ගැන බලාපොරොත්තුවීමද වෙද සතරට ආදරය ඇති හැම පින්වතුන්ගේම යුතුකම බව දන්වනු කැමැත්තෙමු.

මෙවාගේ ඇති සත්‍යතාවය භාවිතා වෙන්ම තම තමන්ට ප්‍රත්‍යක්ෂ වෙනවා ඇත.

මීට:- ශාස්ත්‍රාර්ථී,

වෛද්‍යාචාර්ය වික්ටර් කේ. විජේවික්‍රම